**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උපවගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේදී මෝටර් වාහනවල හා වායු විමෝචන උපකරණවල සමුච්චිත ක්ෂය වෙන්කිරීම පිළිවෙලින් රු.3,332,981 ක් අඩුවෙන් හා රු.338,332 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂය තුළ ද නිවැරදි කර නොතිබුණි. | අවසන් ගිණුම් ශේෂ වටිනාකම නිවැරදි වේ. නිවැරදි වත්කම් උපලේඛනය විගණනයට ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශනවල හා ඊට අදාළ සටහන්වල අගයන් එකිනෙකට සැසඳෙන සේ ගිණුම් පොත් පැවැත්වීම. |

**1.6 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල වසා දැමීමට තීරණය කළ බව භාණ්ඩාගාර ලේකම්ගේ 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි තහවුරු විය. කෙසේ නමුත්, චක්‍රලේඛය පරිදි ඇවරකරුවෙකු පත්කර වත්කම්වලින් වගකීම් නිරවුල්කර ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට 2021 මාර්තු 15 දිනවන විටත් කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී අරමුදලේ ඉතිරි කිරීම් ගිණුමේ ශේෂය පමණක් රු. මිලියන 686 ක් විය. භාර ඔප්පුවක් යටතේ ස්ථාපනය කර තිබුණු මෙම අරමුදලෙහි දෙපාර්ශවයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා එක් පාර්ශවයක් වූ බැවින්, භාර ඔප්පුවේ 11 (අ) ඡේදය පරිදි, භාණ්ඩාගාර | අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස් වී අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන තෙක් අරමුදල | අදාළ නෛතික පරිසරය තුළ අවශ්‍ය කටයුතු ඉටු කිරීම. |

| | |
|---|---|
| ලේකම්වරයාගේ ප්‍රකාශය මත මෙම අරමුදල අහෝසි වේ. ඒ අනුව, ඉහත චක්‍රලේඛය භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කිරීම මත මේ වන විටත් අදාළ ගිවිසුම්ගත බැඳීමෙන් එක් පාර්ශවයක් ඉවත් ව ඇත. මේ නිසා අරමුදල පැවතීමේ නීත්‍යානුකූලභාවය ගැටළුසහගත විය. එසේ හෙයින්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස් වී අදාළ අරමුදල වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගන්නා තෙක් අරමුදල පවත්වා ගෙන යාමට තීරණය කර තිබුණි. | පවත්වා ගැනීමට තීරණය කර තිබුණි. |

**1.7 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) ඇ | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත කාර්යසාධන වාර්තා පිළියෙල කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි කාර්සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 2020.08.28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ඉදිරියේදී වාර්තා ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 250,382,868ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 261,872,618 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,489,750ක පිරිහීමක් නිරීක්ෂණය විය. වර්ෂයේ ආදායම රු.16,220,560 කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංසරණ වායු තත්ත්ව මැනීමේ ස්ථාවර උපකරණ 02ක් හා වායු තත්ත්ව ප්‍රදර්ශක (Digital LED Display Board) 02ක් මිල දී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | |
|---|---|---|
| (i) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 මාර්ගෝපදේශයෙන් බැහැරව මෙම උපකරණ මිල දී ගැනීම සඳහා පළමු වරට 2013 වර්ෂයේ දී ලංසු ලබාගනු ලැබුවද මිල දී ගැනීම් සිදුනොකර නැවත වරක් 2016 වර්ෂයේ දී ලංසු කැඳවා තිබුණි. එහෙත්, ඒ අවස්ථාවේදී ද මිල දී ගැනීම් සිදු කර නොතිබුණි. එසේ වුවද, 2018 වර්ෂයේ ලංසු කැඳවීමේ දී කලින් අවස්ථාවලදී මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයකින් ලැබුණු වැඩි මිල ගණන් මත මිල දී ගැනීම් හේතුවෙන් රු.17,176,000 ක මූල්‍යමය හානියක් සිදුවී තිබුණි. | මෙමගින් වඩාත් නවීන ගුණාංග සහිත උපකරණ මිලදී ගෙන ඇත. මින් ඉදිරියට ප්‍රසම්පාදන කාලසටහන අනුව කටයුතු කරමි | උපරිම කාර්ය සාධනයක් ලබාගත හැකිවන පරිදි රාජ්‍ය මුදල් උපයෝජනය කිරීම. |
| (ii) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) මාර්ගෝපදේශය ප්‍රකාර ප්‍රසම්පාදන දැන්වීම, ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ වෙබ් අඩවියේ පළකර නොතිබුණු අතර, 2016 වර්ෂයේදී රු. 240,982ක් ගෙවා එම දැන්වීම පුවත්පත් 11ක පළකර තිබුණි. ඒ අනුව අදාළ ප්‍රසම්පාදනය අවලංගු කිරීම නිසා වැයකළ එම මුදල නිෂ්ඵල වී තිබුණි. | ආයතන කිහිපයකින් මිල ගණන් ලබා ගැනීමේ අරමුණ ඇතිව වැඩි වශයෙන් අලෙවි වන ප්‍රධාන පුවත් පත්වල දැන්වීම පල කරන ලදී. | උපරිම කාර්ය සාධනයක් ලැබෙන පරිදි මුදල් උපයෝජනය කිරීම. |
| (iii) මිල දී ගත් සංසරණ වායු තත්ත්ව මැනීමේ ස්ථාවර උපකරණ ඒකක 02 ක් හා වායු තත්ත්ව ප්‍රදර්ශන 02ක් මධ්‍යම පරිසර අධිකාරියට ලබා දී තිබුණු අතර ඉතිරි ජංගම වායු සංසරණ ඒකකය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ලබා දී තිබුණි. එම ආයතන විසින් රැස්කළ දත්ත 2019 වර්ෂයේ සිට වායු විමෝචන අරමුදල වෙත සම්ප්‍රේෂණය කළ ද, එම දත්ත ඵලදායි ලෙස වායු තත්ත්ව කළමනාකරණය වෙනුවෙන් උපයෝජනය කර ඇති ද යන්න තහවුරු නොවුණි. තවද, මුළු මිලදී ගැනීම් පිරිවැය රු. මිලියන 130ක් වූ මෙම උපකරණවල ආරක්ෂාව, භාවිතය, නඩත්තුව, මිනුම් ලබා ගැනීම, දත්ත සම්ප්‍රේෂණය යනාදී දෑ පිළිබඳ එකඟතාවක් ඇති වන පරිදි ගිවිසුම්ගත වීමකට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. | එම උපකරණවල සම්පූර්ණ අයිතිය මධ්‍යම පරිසර අධිකාරියට සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට ලබා දීමට තීරණය කර ඇත. | උපරිම කාර්යසාධනයක් ලබාගත හැකිවන පරිදි රාජ්‍ය මුදල් උපයෝජනය කිරීම. |

(ආ) වායු විමෝචන සහතික නිකුත් කිරීම හා ඒ ආශ්‍රිත කටයුතු නියාමනය කිරීමේ ප්‍රධාන කාර්යය හැරුණු කොට 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ මෙම අරමුදල මගින් සිදුකළ වෙනත් කාර්යයක් පැවති බව නිරීක්ෂණය නොවීය. එම

| | | | |
|---|---|---|---|
| | නිසා පහත සඳහන් පරිදි විවිධ කාර්යයන් වෙනුවෙන් අරමුදලින් වැය කළ රු. මිලියන 333 ක මුදල නිෂ්ඵල වී තිබුණි. | | |
| (i) | ඉහත (අ) හි සඳහන් උපකරණ ද ඇතුළුව රු. මිලියන 237ක් වැයකර සංසරණ වායු තත්ත්ව මැනීමේ උපකරණ මිල දී ගැනීම. | වායුවේ ගුණාත්මක බව මැනීම සඳහා සංසරණ වායු තත්වය මැනීමේ උපකරණ මිලදී ගෙන ඇත. | උපරිම කාර්යසාධනයක් ලබාගත හැකිවන පරිදි රාජ්‍ය මුදල් උපයෝජනය කිරීම. |
| (ii) | ඩීසල් හා පෙට්‍රල් එන්ජින් පරීක්ෂා කිරීම සඳහා පිළිවෙලින් පාරාන්ධතා මනු **(Opacity Meters)** 43 ක් හා වායු විශ්ලේෂක **(Gas Analyzers)** 32ක් රු. 72,628,764කට මිල දී ගැනීම. | පිළිතුරු සම්පූර්ණ ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | -එම- |
| (iii) | එකතුව රු.23,026,650ක් වැයකර වායු දූෂණය ඇගයීම වෙනුවෙන් සිදුකළ පර්යේෂණ 02ක පර්යේෂණ වාර්තා නොලැබීම හා තවත් පර්යේෂණ 02ක පර්යේෂණ වාර්තා ලැබී තිබුණද, එහි සඳහන් නිර්දේශ මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබීම. | අදාළ වාර්තා කඩිනමින් ලබා ගනිමි. ලද පර්යේෂණ වාර්තා ප්‍රතිපත්තිමය තීරණ සඳහා වායු තත්ව කළමනාකරණ කේන්ද්‍රය වෙත යොමු කර ඇත. | -එම- |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉහළ පොලී ප්‍රතිශතයක් සහිත ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු රු. 1,270,934,392ක් සමාලෝචිත වර්ෂය තුළ දී ඉවත්කර ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. එම හේතුවෙන් වැඩි පොලී මුදලක් ලබා ගැනීමට තිබූ වාසිදායක තත්ත්වය අරමුදලට අහිමි වී තිබුණි. | රට තුල පැවති වසංගත තත්වය නිසා නිවසේ සිට වැඩ කිරීමත්, ඒකාබද්ධ අරමුදලට මිලියන 750ක් බැර කිරීමත් නිසා ඉහත මුදල ආයෝජනය කිරීමට නොහැකි විය. විගණනය පෙන්වා ඇති පරිදි අතිරික්ත මුදල ඵලදායි ලෙස ආයෝජනය කිරීමට සටහන් කර ගන්නා ලදී. | රාජ්‍ය අරමුදල් වාසිදායක ලෙස මෙහෙයවීම. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය ලේඛනමය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| මූලික වියදම් සංරචක 04ක අධි ඇස්තමේන්තු සකස් කිරීම නිසා සියයට 69 ක සිට සියයට 99 ක් අතර පරාසයක ඉතිරිවීම් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. | වසංගත තත්ත්වය නිසා සැලසුම් කළ වැඩසටහන් ඉටුකළ නොහැකි විය. විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි අයවැය ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා සටහන් කර ගන්නා ලදි. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |